JMC vLearning

"your virtual learning partner"

# ආර්ථික විද්‍යාව - ECN 103


Prepared by - Chinthaka Kelum Udayasiri

Visiting Lecturer (University of Colombo)

BBA (SP) Mgt (University of Colombo)

Gold Medalist (University of Colombo)

CIM (UK) Passed Finalist

AAT Passed Finalist

# විෂය අන්තර්ගතය හා බර තැබීම

- ව්‍යාපාර පරිසරයට අදාළ ආර්ථික සංකල්ප හා ආර්ථික පද්ධති - 15%
- ඉල්ලුම, සැපයුම, සමතුලිතය හා රජය මැදිහත්වන ආකාරය - 20%
- නිෂ්පාදන ක්‍රියාවලියේ හැසිරීම සහ විවිධ වෙළඳපොළ ව්‍යුහයන් - 15 %
- ජාතික ගිණුම්කරණය හා රජයේ කාර්යභාරය - 20%
- මුල්‍ය පද්ධතිය, මුදල් හා සාමාන්‍ය මිල මට්ටම - 15%
- අන්තර්ජාතික වෙළඳාම හා විදේශ විනිමය වෙළඳපොළ - 10%
- ආර්ථික වර්ධනය, සංවර්ධනය හා ආර්ථිකයේ නව ප්‍රවණතා - 5%

©JMC vLearning

# ආර්ථික විද්‍යාව නිර්වචනය කිරීම

"සීමිත සම්පත් භාවිතා කොට අසීමිත වුවමනා ඉටුකර ගැනීමට යාමේදී මිනිසා විසින් තේරීම් සිදුකරනු ලබන ආකාරය හා ඉන් මතුවන ප්‍රතිවිපාක අධ්‍යයනය කරනු ලබන විෂය ක්ෂේත්‍රය ආර්ථික විද්‍යාවයි"




විකල්ප භාවිතා සහිත හිඟ සම්පත් හා මිනිස් වුවමනා අතර පවතින සම්බන්ධතාවයේ මිනිස් හැසිරීම අධ්‍යයනය කෙරෙන විද්‍යාව යි.

Lionel Robbins ( 1898 – 1984 )

එදිනෙදා ව්‍යාපාරික ජීවිතයේ මිනිසුන් කටයුතු කරන ආකාරය අධ්‍යයනය කරනු ලබන විෂයයි.

Alfred Marshall (1842 – 1924)




©JMC vLearning

# ආර්ථික විද්‍යාව විද්‍යාවක් ලෙස

**ආර්ථික විද්‍යාව විද්‍යාවකි.**

**විද්‍යාත්මක ක්‍රමය අනුගමනය කරනු ලබන ඕනෑම විෂයක් විද්‍යාවක් ලෙස සැළකේ.**




JMC vLearning
"your virtual learning partner"

# ආර්ථික විද්‍යාව විද්‍යාවක් ලෙස

- විද්‍යාත්මක ක්‍රමය

නිරීක්ෂණය වීම

කල්පිත ගොඩනැගීම

පරීක්ෂණය සැලසුම් කිරීම

දත්ත ලබා ගැනීම හා විශ්ලේෂණය

නිගමනය

JMC vLearning "your virtual learning partner"

©JMC vLearning

# ආර්ථික විද්‍යාව සමාජීය විද්‍යාවක් ලෙස

"ආර්ථික විද්‍යාව මගින් සමාජයේ ජීවත් වන මිනිසුන්ගේ තාර්කික හැසිරීම් රටාවන් ආර්ථික දෘෂ්ටි කෝණයෙන් අධ්‍යයනය කරන බැවින් ආර්ථික විද්‍යාව සමාජීය විද්‍යාවකි"




JMC vLearning "your virtual learning partner"

# ආර්ථික විද්‍යාව හා ස්වභාවික විද්‍යාවන් අතර වෙනස

ආර්ථික විද්‍යාව මගින් මිනිසුන්ගේ ආර්ථිකහැසිරීම විග්‍රහ කිරීම.

මිනිස් හැසිරීම් කාලය, ප්‍රදේශය පරිසරය අනුව වෙනස් වීම

ගොඩනැගෙන ආර්ථික න්‍යායන් පර්යේෂණාගාර තුල සනාථ කළ නොහැකි වීම.

JMC vLearning "your virtual learning partner"

©JMC vLearning

# ආර්ථික විද්‍යාව හැදෑරීමේ ප්‍රයෝජන

- ආර්ථික සංසිද්ධීන් වඩාත් හොඳින් තේරුම් ගත හැකි වීම.
- රාජ්‍ය පාලන කටයුතු වලදී භාවිතා කළ හැකි වීම.
- නිෂ්පාදකයන්ට, පාරිභෝගිකයන්ට හා ආයෝජකයන්ට ඵලදායි තීරණ ගැනීමට වැදගත් වීම.
- තාර්කික පාරිභෝගිකයෙකු ලෙස කටයුතු කිරීමට වැදගත් වීම.
- ඡන්ද දායකයන්ට වැදගත් වීම.
- පාසැල් ශිෂ්‍යයන්ට තීරණ ගැනීමට වැදගත් වීම.

JMC vLearning
"your virtual learning partner"
©JMC vLearning

# සුක්ෂම ආර්ථික විද්‍යාව

" ආර්ථිකය සමන්විතව ඇති එක් එක් අංශ, ආයතන, පුද්ගලයන් හා ආර්ථික විචල්‍යයන් ආදී කුඩා ඒකකයන් වෙන් වෙන් වශයෙන් ගෙන ඒවායේ හැසිරීම අධ්‍යයනය කිරීම සුක්ෂම ආර්ථික විද්‍යාවයි "



©JMC vLearning

# සාර්ව ආර්ථික විද්‍යාව

" ආර්ථික පද්ධතිය සමස්ථයක් ලෙස ගෙන එහි ක්‍රියාකාරීත්වය, කාර්යසාධනය හා ව්‍යුහය යනාදිය අධ්‍යයනය කිරීම සාර්ව ආර්ථික විද්‍යාවයි "




JMC vLearning
"your virtual learning partner"
©JMC vLearning

# යථානුරූපී ආර්ථික විද්‍යාව

කුමක් ද?

කුමක් වුයේද?

කුමක් වනු ඇද්ද?

- ඉහත ප්‍රකාශයන්ගේ නිරවද්‍යතාවය පරීක්ෂාවට ලක් කළ හැකිය.
- එබැවින් සත්‍ය නම් පිළිගැනීමත් අසත්‍ය නම් ප්‍රතික්ෂේප කිරීමත් සිදු කරයි.
- ආර්ථික න්‍යායන් පාදනම් වන්නේ මෙම ප්‍රකාශයන් මත වේ.

උදා - භාණ්ඩයක මිලත් ඉල්ලුම් ප්‍රමාණයත් අතර ප්‍රතිලෝම සම්බන්ධයක් පවතී.

ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 22 කි.

JMC vLearning
"your virtual learning partner"

©JMC vLearning

# අභිමතානුරූපී ආර්ථික විද්‍යාව

" යමක් සිදුවිය යුතු ආකාරය පිළිබඳව අධ්‍යයනය කෙරෙන සහ ඒ පිළිබඳව අදහස් හා යෝජනා ප්‍රකාශ කෙරෙන ආර්ථික විද්‍යාත්මක ප්‍රකාශ "

අභිමතානුරූපී ප්‍රකාශ ලෙස හැඳින්වේ

- ❖ පුද්ගලයන්ගේ අදහස් මත රඳා පවතින බැවින් මේවා පුද්ගලබද්ධ ප්‍රකාශ වේ.
- ❖ එබැවින් සැබෑ ලොව දත්ත මත සත්‍යතාව පරීක්ෂා කිරීමට අපහසු වේ.

JMC vLearning "your virtual learning partner"

# අභිමතානුරූපී ආර්ථික විද්‍යාව







JMC vLearning
"your virtual learning partner"


# අවශ්‍යතා හා වුවමනා

➢ <u>අවශ්‍යතා</u>

මිනිසෙකු වශයෙන් ජීවත් වීමට අවශ්‍ය මූලිකම දෑ අවශ්‍යතා ලෙස හැඳින්වේ. එබැවින් මිනිස් අවශ්‍යතා බොහෝ විට ජීව විද්‍යාත්මක පදනමක් ගනී.

උදා - ආහාර, අධ්‍යාපනය, සෞඛ්‍ය, ප්‍රවාහනය, සන්නිවේදනය

**මූලික අවශ්‍යතා** ▶




JMC vLearning
virtual learning partner"
©JMC vLearning


# අවශ්‍යතා හා වුවමනා

➢ <u>වුවමනා</u>

අවශ්‍යතා සපුරා ගන්නා විවිධ ස්වරූපයන් වේ.

එසේත් නැතහොත් භාණ්ඩ හා සේවා පරිභෝජනය කිරීමට මිනිසා තුළ පවතින අසීමිත ආශාවයි

උදා -




JMC vLearning
virtual learning partner

# අවශ්‍යතා හා වුවමනා

| අවශ්‍යතා | වුවමනා |
| --- | --- |
| ➢ සීමිත වේ | ➢ අසීමිත වේ |
| ➢ සරලය | ➢ සංකීර්ණ වේ |
| ➢ අනිවාර්යයෙන් සපුරා ගත යුතුය | ➢ සපුරා ගැනීම අනිවාර්ය නොවේ |
| ➢ නිර්මාණය කළ නොහැක | ➢ නිර්මාණය කළ හැක |
| ➢ ප්‍රාථමික වේ | ➢ ද්විතීක වේ |

JMC vLearning "your virtual learning partner"

©JMC vLearning

# පසුගිය විභාග ප්‍රශ්න

1.1 පහත සඳහන් ඒවා අතුරෙන්, සූක්ෂම ආර්ථික විද්‍යාවේ (Micro-Economics) සංරචකයක් (component) වන්නේ කුමක් ද?

(1) සමාහාර නිමවුම.
(2) පාරිභෝගිකයන් හෝ කුටුම්භයන්.
(3) උද්ධමනය.
(4) සේවා වියුක්ති මට්ටම.

(c) අවශ්‍යතා සහ වුවමනා අතර වෙනස, එකිනෙකට උදාහරණයක්ද සමඟ, **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

©JMC vLearning

# පසුගිය විභාග ප්‍රශ්න

1.2 අගිමතානුරූපී (normative) ආර්ථික ප්‍රකාශ සම්බන්ධයෙන්, පහත සඳහන් ප්‍රකාශ සළකා බලන්න:

**(a)** එමගින් "යමක් සිදුවිය යුතු ආකාරය" සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීම සිදු වේ.

**(b)** එය පුද්ගලානුබද්ධ වටිනාකම් විනිශ්චයන් මත පදනම් වේ.

**(c)** එය සැබෑ ලෝකයේ පවතින තොරතුරු සහ සංඛ්‍යා මගින් විමසා බැලිය හැකිය.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ:

(1) **(a)** සහ **(b)** පමණි.
(2) **(a)** සහ **(c)** පමණි.
(3) **(b)** සහ **(c)** පමණි.
(4) ඉහත සඳහන් සියල්ලම.

JMC vLearning "your virtual learning partner"

©JMC vLearning

# පසුගිය විභාග ප්‍රශ්න

(c) ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාවක් ලෙස සලකනු ලබන්නේ ඇයිද යන්නට හේතුව **පැහැදිලි කරන්න.** (ලකුණු 02)

1.3 2021 වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව, 2021 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන අනුපාතය වූයේ:

(1) 2.3%. (2) 3.1%. (3) 3.7%. (4) 4.5%.

"JMC vLearning "your virtual learning partner"

©JMC vLearning

# සම්පත්

භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා යොදා ගනු ලබන ඕනෑම දෙයකි.




JMC vLearning
"your virtual learning partner"
©JMC vLearning

# සම්පත්

❑ ආර්ථික නොවන සම්පත්

සැපයුමෙහි හිඟකමක් දක්නට නොමැති ස්වභාවධර්මයෙන් නොමිලේ ලැබෙන සම්පත්, ආර්ථික නොවන සම්පත් වේ.





JMC vLearning "your virtual learning partner"

# සම්පත්

## ❑ ආර්ථික සම්පත්

අසීමිත මිනිස් වුවමනාවන්ට සාපේක්ෂව සැපයුම සීමා සහිත හෝ හිඟකමක් දක්නට ඇති සම්පත් ආර්ථික සම්පත් ලෙස අදහස් කරේ




- භූමිය
- ශ්‍රමය
- ප්‍රාග්ධනය
- ව්‍යවසාය

©JMC vLearning

# සම්පත්

| ආර්ථික සම්පත් | ආර්ථික නොවන සම්පත් |
|---|---|
| ➢ සැපයුම සීමා සහිත වේ | ➢ සැපයුමේ හිඟකමක් නොමැත |
| ➢ භාවිතයේදී ආවස්ථික පිරිවැයක් හටගනී | ➢ භාවිතයේදී ආවස්ථික පිරිවැයක් හට නොගනී |
| ➢ භාවිතයේදී තේරීමක් කලයුතු වේ | ➢ භාවිතයේදී තේරීමක් කළ යුතු නොවේ |
| ➢ හිමිකමක් පවතී | ➢ හිමිකමක් නොපවතී |
| ➢ මිලක් අයකළ හැක | ➢ මිලක් අය කළ නොහැක |

JMC vLearning "your virtual learning partner"

©JMC vLearning

# ආර්ථික සම්පත්

## ❑ භූමිය

ස්වභාවධර්මයාගේ දායාද ලෙස ලැබී ඇති නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගන්නා ස්වභාවික සම්පත් භූමිය ලෙස අදහස් කෙරේ.

උදා - වනාන්තර, ඛණිජ සම්පත්, ඇල දොළ

## ❑ භූමියේ ලක්ෂණ

- ස්වභාවික සම්පතක් වීම
- සාපේක්ෂ වශයෙන් අනම්‍ය සැපයුමක් තිබීම
- සංචලනයට බාධා පැවතීම
- ඵලදායීතාවය වර්ධනය කළ හැකි වීම



JMC vLearning "your virtual learning partner"

# ආර්ථික සම්පත්

- භූමිය

නිෂ්පාදන සාධකයක් ලෙස භූමිය සඳහා කරන ගෙවීම බදු කුලියයි.

| | |
|---|---|
| ප්‍රතිෂ්ඨාපනය කළ හැකි සම්පත් | ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි සම්පත් |

"JMC vLearning "your virtual learning partner"

©JMC vLearning

# ආර්ථික සම්පත්

## ❑ ශ්‍රමය

භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනය කිරීම සඳහා යොදාගනු ලබන කායික හෝ මානසික වෙහසක් ශ්‍රමය ලෙස අදහස් කෙරේ. මේ සඳහා කරනු ලබන ගෙවීම වැටුප වේ.

උදා -කම්කරුවන්, පෙදරේරුවන්, ගනකාධිකාරීවරු,කථිකාචාර්යවරු

## ❑ ශ්‍රමයේ ලක්ෂණ



- සජීවී සම්පතක් වීම
- සමජාතීය නොවීම
- සංචලනයට බාධා නොවීම
- අධ්‍යාපනය හා පුහුණුව තුළින් ඵලදායීතාවය වර්ධනය කළ හැකි වීම.

JMC vLearning "your virtual learning partner"
©JMC vLearning

# ආර්ථික සම්පත්

## ❑ ප්‍රාග්ධනය

භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනය කිරීම සඳහා යොදා ගන්නා මිනිසා විසින් නිෂ්පාදිත ආධාරකයන් ප්‍රාග්ධනය ලෙස හැඳින් වේ. මේ සඳහා කරනු ලබන ගෙවීම පොළිය වේ.

උදා - ගොඩනැගිලි, යන්ත්‍රසූත්‍ර, උපකරණ

## ❑ ප්‍රාග්ධනයේ ලක්ෂණ

- ප්‍රාග්ධනය මූර්ත සංකල්පයක් වීම
- නැවත නැවත නිෂ්පාදනයට යොදා ගත හැකි වීම
- මිනිසා විසින් නිර්මාණය කරන ලද නිෂ්පාදන සාධකයක් වීම
- භාවිතයත් සමඟ ක්ෂය වීම

©JMC vLearning

# ආර්ථික සම්පත්

- ව්‍යවසායකත්වය

අනෙකුත් නිෂ්පාදන සම්පත් නිසිලෙස සංවිධානය කරමින් අවධානම් දැරීම තුළින් ප්‍රතිපත්තිමය තීරණ ගනිමින් නව්‍යතා සම්පාදනය කිරීමේ ප්‍රයත්නය යි. මේ සඳහා කරනු ලබන ගෙවීම ලාභය වේ.

- ව්‍යවසායකත්වයේ ලක්ෂණ

- නිෂ්පාදන කටයුතු සංවිධානය කිරීම
- අවදානම් දැරීම
- නව්‍යතාවයන් හඳුන්වා දීම
- ප්‍රතිපත්තිමය තීරණ ගැනීම



JMC vLearning "your virtual learning partner"

©JMC vLearning

# මූලික ආර්ථික සංකල්ප

1. හිඟකම
2. තේරීම
3. ආවස්ථික පිරිවැය

JMC vLearning
"your virtual learning partner"

©JMC vLearning

# පසුගිය විභාග ප්‍රශ්න

1.2 පහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යවසායකත්වය සඳහා ඇති ප්‍රතිලාභය (reward) වන්නේ කුමක් ද?

(1) වැටුප්. (2) පොලිය. (3) ලාභය. (4) බදු කුලිය.

(c) ආර්ථික විද්‍යාවේ එන ආවස්ථික පිරිවැය යන සංකල්පය උදාහරණයක් සමඟ **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(a) ආර්ථිකයක ප්‍රධාන ආර්ථික සම්පත් (නිෂ්පාදන සාධක) හතර(04) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(c) (i) ආර්ථික විද්‍යාවේ "තේරීම" (choice) යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

JMC vLearning "your virtual learning partner"

# පසුගිය විභාග ප්‍රශ්න

1.2 පහත සඳහන් ඒවා අතුරෙන්, ආර්ථික විද්‍යාවේ "හිඟකම" සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න:

(1) එය අදාල වනුයේ ලෝකයේ දුප්පත් රටවලට පමණි.

(2) භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේදී සම්පත්වල විකල්ප භාවිතයන් පිළිබඳ එමගින් පැහැදිලි කරයි.

(3) එය, මිනිස් අවශ්‍යතා සහ වුවමනා සපුරාලීම සඳහා ඇති සම්පත්වල සීමිත බව වේ.

(4) එය, ආර්ථික ක්‍රියාකාරකම් සඳහා උපයෝජනය නොකල සම්පත් භාවිතයේදී පැන නගියි.

1.3 යම් තීරණයක් තෝරා ගැනීමේදී කැප කරනු ලබන ඊළඟ හොඳම විකල්පයේ වටිනාකම හඳුන්වනු ලබන්නේ:

(1) ආර්ථික පිරිවැය ලෙසයි.

(2) සාමාන්‍ය පිරිවැය ලෙසයි.

(3) ආවස්ථික පිරිවැය ලෙසයි.

(4) ආන්තික පිරිවැය ලෙසයි.

©JMC vLearning

# පසුගිය විභාග ප්‍රශ්න

(c) නිෂ්පාදන සාධකයක් ලෙස ශ්‍රමයේ ඇති ලක්ෂණ තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, ප්‍රාග්ධනය සඳහා ඇති ප්‍රතිලාභය (reward) වන්නේ කුමක් ද?

(1) පොලිය. (2) කුලිය. (3) ලාභය. (4) වැටුප්.

**1.1** මිනිස් අවශ්‍යතා සහ වුවමනාවන් සපුරා ගැනීම සඳහා පවතින සම්පත්වල සීමිත බව හඳුන්වනු ලබන්නේ:

(1) ආවස්ථික පිරිවැය ලෙසයි. (2) හිඟකම ලෙසයි.

(3) ආර්ථික පිරිවැය ලෙසයි. (4) තේරීම ලෙසයි.

(b) ආර්ථික සම්පතක් වශයෙන් භූමියේ ඇති ලක්ෂණ දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

©JMC vLearning

# පසුගිය විභාග ප්‍රශ්න

1.1 පහත සඳහන් ඒවා අතුරෙන්, ආර්ථික නොවන සම්පතක් සඳහා උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) ආහාර. (2) වාසස්ථාන. (3) ගොඩනැගිල්ල. (4) හිරු එළිය.

(a) "ආවස්ථික පිරිවැය" යන පදය සුදුසු උදාහරණයක් සමඟින් **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

1.1 පහත සඳහන් ඒවා අතුරෙන්, භූමිය සඳහා වන ප්‍රතිලාභය කුමක් ද?

(1) ලාභය. (2) කුලිය. (3) පොලිය. (4) වේතන.

1.1 පහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යවසායකත්වය සඳහා වන ප්‍රතිලාභය කුමක් ද?


(1) පොලිය. (2) කුලිය. (3) ලාභය. (4) වේතන.

JMC vLearning
your virtual learning partner
©JMC vLearning

# මූලික ආර්ථික සංකල්ප

## ❑ හිඟකම

හිඟකම යනුවෙන් අදහස් කරනුයේ අසීමිත මිනිස් වුවමනා සපුරා ගැනීමට සමාජය සතුව පවත්නා සම්පත් ප්‍රමාණවත් නොවීමයි.




JMC vLearning "your virtual learning partner"

# මූලික ආර්ථික සංකල්ප

හිඟකම සම්බන්ධයෙන් අවධාරණය කළ යුතු කරුණු

- ✓ හිඟකම යනු සාපේක්ෂ සංකල්පයක් වීම

  (අසීමිත වුවමනාවන්ට සාපේක්ෂව සම්පත් සීමිත වීමයි)

- ✓ හිඟකම යනු සෑම සමාජයකටම පොදු වූ සංකල්පයක් බව
- ✓ හිඟකම තුළින් තේරීමේ ප්‍රශ්නයක් අවධාරණය වීම
- ✓ හිඟකම යනු දුප්පත්කම නොවන බව
- ✓ හිඟකම හා හිඟය (ඌනතාවය) එකිනෙකට වෙනස් සංකල්පයන් බව


JMC vLearning "your virtual learning partner"

©JMC vLearning

# මූලික ආර්ථික සංකල්ප

- තේරීම

සම්පත් හිඟ නිසාත් ඒවායේ විකල්ප භාවිත පවතින නිසාත් එම හිඟ සම්පත් භාවිතා කොට කවර වුවමනා සපුරා ගන්නේද ? යන්න තීරණය කිරීම තේරීම ලෙස හැඳින්වේ.




JMC vLearning "your virtual learning partner"

©JMC vLearning

# මූලික ආර්ථික සංකල්ප

- තේරීම

උදා - පුද්ගලයෙකු සතුව රු. 1000 ක මුදලක් තිබෙන අතර ඔහු එම මුදලින් පොතක් මිලට ගැනීම, චිත්‍ර පටයක් නැරඹීම හා දිවා ආහාරයක් ලබා ගැනීම යන විකල්පයන් සළකා බලයි. මෙම සියලු විකල එකවර ඉතු කරගැනීමට නොහැකි බැවින් එක් විකල්පයක් තෝරා ගැනීමට සිදුවේ.

ඕනෑම සමාජයක් විසින් කළ යුතු මූලික තේරීම්

- කුමක් කොපමණ ප්‍රමාණයකින් නිපදවන්නේද ?
- කෙසේ නිපදවන්නේද ?
- කා සඳහා නිපදවන්නේ ද ?

JMC vLearning "your virtual learning partner"

©JMC vLearning

# මූලික ආර්ථික සංකල්ප

❑ ආවස්ථික පිරිවැය

විකල්ප අතුරින් එක් විකල්ප අවස්ථාවක් තෝරා ගැනීම නිසා කැපකිරීමට සිදුවන ඊළඟ හොඳම විකල්ප අවස්ථාවේ වටිනාකම ආවස්ථික පිරිවැය යි.

උදා -

ඉහත තේරීමේ ප්‍රශ්නයේදී භාවිතා කළ උදාහරණයට අනුව එම පුද්ගලයා විසින් රු. 1000 ක මුදලින් චිත්‍ර පටයක් නැරඹීම තෝරා ගත්තේ නම්, ඒ වෙනුවෙන් කැපකළ ඊළඟ හොඳම විකල්ප අවස්ථාව පොතක් මිලදී ගැනීම නම්, චිත්‍ර පටය නැරඹීමේ ආවස්ථික පිරිවැය අහිමි වූ පොතයි.

JMC vLearning "your virtual learning partner"

©JMC vLearning

# මූලික ආර්ථික සංකල්ප

ආවස්ථික පිරිවැය සම්බන්ධයෙන් අවධාරණය කළ යුතු කරුණු

- ✓ ආවස්ථික පිරිවැය ආත්මගත සංකල්පයකි

එනම් ආවස්ථික පිරිවැය අවධාරණය කළ හැක්කේ අදාළ තේරීම කරනු ලබන පුද්ගලයාට පමණි.

- ✓ ආවස්ථික පිරිවැය මූර්ත සංකල්පයක් වීම

එනම් ආවස්ථික පිරිවැය ගණනය කරනුයේ මුල්‍ය ඒකක වලින් නොව මූර්ත ඒකකයන්ගෙනි.

- ✓ ආවස්ථික පිරිවැය තුළ බාහිර පිරිවයද අන්තර්ගත වේ

ඇතැම් අවස්තාවලදී ආවස්ථික පිරිවැය අදාළ තේරීම කරනු ලබන පුද්ගලයාට පමණක් සීමා නොවන අවස්ථා ඇත.

JMC vLearning "your virtual learning partner"

# මූලික ආර්ථික සංකල්ප


❑ ආවස්ථික පිරිවැය ශූන්‍ය විය හැකි අවස්ථා

- සම්පත් වල හිඟකමක් නොපවතින අවස්ථා වලදී
- සම්පතක විකල්ප ප්‍රයෝජන නොමැති අවස්ථාවකදී
- සේවා වියුක්ත සම්පත් සේවා නියුක්ත කිරීමේදී

©JMC vLearning

# භාණ්ඩ හා සේවා

මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරා ලීම සඳහා භාවිතා කරනු ලබන ඕනෑම දෙයක් භාණ්ඩ හා සේවා ලෙස හැඳින්වේ.




JMC vLearning
"your virtual learning partner"

# භාණ්ඩ හා සේවා

❑ ආර්ථික භාණ්ඩ

සැපයුමේ හිඟකමක් දක්නට ලැබෙන භාණ්ඩ ආර්ථික භාණ්ඩ ලෙස හැඳින්විය හැක. මෙම භාණ්ඩ නිෂ්පාදනයේදී හා පරිභෝජනයේදී ආවස්ථික පිරිවැයක් දරනු ලැබේ.

උදා - වෙළඳපොළෙහි විකිණීම සඳහා ඇති ඕනෑම භාණ්ඩයක්

ආර්ථික භාණ්ඩ වල ලක්ෂණ

- සැපයුමේ හිඟකමක් දක්නට ලැබීම
- භාවිතයේදී තේරීමක් කළ යුතු වීම
- ආවස්ථික පිරිවැයක් පැවතීම
- සම්පත් පිරිවැයක් පැවතීම
- හිමිකමක් පැවතීම
- බොහෝ ආර්ථික භාණ්ඩ වලට මිලක් පැවතීම
- නිෂ්පාදන ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස බිහිවීම

JMC vLearning
"your virtual learning partner"
©JMC vLearning

# භාණ්ඩ හා සේවා

❑ ආර්ථික නොවන භාණ්ඩ

ශූන්‍ය මිලකදී අසීමිතව පරිභෝජනය කළ හැකි භාණ්ඩ ආර්ථික භාණ්ඩ ලෙස හැඳින්විය හැක.

උදා - හිරු එළිය, වැසි ජලය, වාතය

ආර්ථික භාණ්ඩ වල ලක්ෂණ

- සැපයුමේ හිඟකමක් දක්නට නොලැබීම
- භාවිතයේදී තේරීමක් කළ යුතු නොවීම
- ආවස්ථික පිරිවැයක් නොමැති වීම
- සම්පත් පිරිවැයක් නොමැති වීම
- නිශ්චිත හිමිකමක් දක්නට නොමැති වීම
- මිලක් නොපැවතීම
- ස්වභාව ධර්මයේ දායාදයක් වීම

JMC vLearning "your virtual learning partner"

©JMC vLearning